**නාට්‍ය, මුද්‍රා නාට්‍ය හා සමකාලීන නර්තන අධ්‍යයනාංශයේ , රූපණය, නාට්‍ය රචනය සහ අධ්‍යක්ෂණය යන උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේ අභියෝග්‍යතා පරීක්ෂණය**

උක්ත පරීක්ෂණයේ දී අපේක්ෂක අපේක්ෂිකාවන්ට ලකුණු ලැබෙනු ඇත්තේ පරීක්ෂණ මණ්ඩල 04 කින් දෙනු ලබන ලකුණුවල එකතුවක් හැටියටය. එක් එක් මණ්ඩලයේ පරීක්ෂකවරුන් විසින් තනි තනිව සිය ස්වාධීන ලකුණු ලැයිස්තුව බැගින් ලබාදිය යුතුය. ඒ සඳහා විශ්වවිද්‍යාල අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිර ප්‍රවීණයන්ගෙන්ද පරීක්ෂණ මණ්ඩල සමන්විත වේ. පරීක්ෂණ මණ්ඩලය සාමූහිකව කථා කොට ලකුණු ලබාදීම සපුරා තහනම් වේ. එසේ තනි තනිව ලකුණු දෙන පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව 20ක් හෝ ඊට වැඩිය. විනිවිධභාවය සහතික කිරීම, බලපෑම් කිරීමට ඇති අවකාශය ඉවත් කිරීම හා අපේක්ෂක අපේක්ෂිකාවන්ට ඉහළම සාධාරණයක් ඉෂ්ඨ කිරීම පිණිස මෙම ක්‍රමවේදය විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරනු ලැබේ.

**(1) පළමු පරීක්ෂණය**

නාට්‍ය ප්‍රබන්ධනය, අධ්‍යක්ෂණය සහ විචාරය යන අංශ පිලිබඳ ව අපේක්ෂකයා/අපේක්ෂිකාවගේ කුසලතාව සහ දැනුම මෙහිදී පරීක්ෂා කෙරේ. මෙය පැය 02ක ලිඛිත පරීක්ෂණයකි. අපේක්ෂකයා/අපේක්ෂිකාව කොටස් 4 ක් යටතේ පිළිතුරු සැපයිය යුතු වේ.

**ඇගයීම**

| | | |
|---|---|---|
| i | දෙනු ලබන නාටකීය අවස්ථාවලින් එකක් සඳහා සංවාද 10කට නොඅඩු නාට්‍ය රචනයක් | - 10 |
| ii | නම් කරනු ලබන ජනප්‍රිය කතාන්දර (ජන කතා, සුරංගනා කතා ආදී වූ ප්‍රබන්ධ) අතුරින් එකක් සඳහා වෙනස් අවසානයක් ලබාදීම (වචන 200-300) | - 10 |
| iii | අඩක් සම්පූර්ණ කරන ලද කුඩා නාටකීය අවස්ථා පෙළක/කතාන්දරයක ඉතිරි අඩ සම්පූර්ණ කිරීම (වචන 200-300) | - 10 |
| iv | අපේක්ෂකයා/අපේක්ෂිකාව මෑත දී දුටු නාට්‍යයක් හෝ චිත්‍රපටයක් පිළිබඳ විචාරාත්මක රචනයක් (අදාළ කෘතියේ රචනය, අධ්‍යක්ෂණය, රංගනය වැනි අංශවල සරු නිසරු ලක්ෂණ පිළිබඳ විස්තර සහ නිදර්ශන සහිතව, වචන 400-500) | - 10 |
| | | 40 |

**(2) දෙවන පරීක්ෂණය**

අපේක්ෂකයා/අපේක්ෂිකාව සතු රංගනය හා තදනුබද්ධ අභිවහන කලා පිළිබඳ ශක්‍යතා මෙහිදී පරීක්ෂාවට ලක් කෙරේ. එක් එක් කොටසක් සඳහා ලබාදෙන උපරිම කාලය මිනිත්තු 05 කි. මෙම පරීක්ෂණයේ පළමු, දෙවන සහ තෙවන කොටස් සඳහා සූදානම් වී පැමිණීමේ අවස්ථාව අපේක්ෂකයින්ට/අපේක්ෂිකාවන්ට ලැබේ.

**ඇගයීම**

| | | |
|---|---|---|
| i | නිර්දේශ කරනු ලබන කේවල භාෂිය (Monologue) නාට්‍යයක කොටසක් (කේවල භාෂිය නාට්‍ය රචනාවලින් තෝරාගත් කොටස් 6ක් අධ්‍යයනාංශය මගින් නිර්දේශ කරනු ලබන අතර ඉන් එකක් ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වී පැමිණිය යුතු වෙයි.) | - 10 |
| ii | අපේක්ෂකයා/අපේක්ෂිකාවගේ අභිමතය පරිදි තෝරාගත් ගායනයක්/වාදනයක්/නර්තනයක් | - 10 |
| iii | අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් නිර්මාණය කොට සකසාගන්නා ලද ඕනෑම ආකාරයක නාට්‍යමය ඉදිරිපත් කිරීමක් (මෙය අවස්ථා නිරූපණයක්, කේවල භාෂිය නාට්‍යයක්,අභිරූපණ රංගනයක්, සජීව හාස්‍යජනක කතාකීමේ රංගනයක් -Stand-up-comedy- ආදී වශයෙන් වූ ඕනෑම ඉදිරිපත් කිරීමක් විය හැකිය) | - 10 |
| iv | එසැණ නිරූපණයක් (Improvisation) | - 10 |
| | | 40 |

## (3) තෙවන පරීක්ෂණය - වාචික

**ඇගයීම**

i නාට්‍ය හා රංගකලාව විෂයය හැදෑරීමට හේතු වූ කාරණාත්, විෂයය පිළිබඳ අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ ආකල්පයන් විමසීම.

ii අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ සමකාලීන සමාජ-දේශපාලනික තත්ත්වයන් පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය විමසීම.

ඉහත ශීර්ෂය යටතේ ඇගයීමේ මණ්ඩලය විසින් අසනු ලබන කෙටි ප්‍රශ්න ඇසුරින් අපේක්ෂකයා/අපේක්ෂිකාව සතු සාමාන්‍ය දැනීමත්, අදහස් ප්‍රකාශ කිරීමේ කුසලතාවත් පරීක්ෂා කෙරේ. වාචික පරීක්ෂණය සඳහා එක් අයෙකුට ලැබෙන උපරිම කාලය මිනිත්තු 10 කි. ලබාදිය යුතු උපරිම ලකුණු ප්‍රමාණය 10 කි.

## (4) සිව්වන පරීක්ෂණය

කැඳවනු ලබන අපේක්ෂකයා/අපේක්ෂිකාව ඔවුන්ගේ කුසලතා සහ ජයග්‍රහණ සඳහා දිනා ඇති සහතික, පදක්කම්, නාට්‍ය රඟදැක්වීම් ඇතුළු විෂයාශ්‍රිත ක්‍රියාකාරකම්වල ඡායාරූප සහ ප්‍රශංසනාත්මක ලිපි ආදියෙන් සමන්විත සාක්ෂි ගොනුවක් (Portfolio) සම්මුඛ පරීක්ෂණය සඳහා රැගෙන ආ යුතුය.

ප්‍රසංගමය ඉදිරිපත් කිරීමක් සඳහා දේශීය මට්ටමේ හැකියාවන් සඳහා ප්‍රථම ස්ථානයකට එක් ලකුණක් ද ඉතිරි ස්ථාන සඳහා දශමස්ථාන වලින් ලකුණු එකතු වන ආකාරයට ද ජාත්‍යන්තර මට්ටමේ දිනා ඇති පදක්කම් හෝ සහතිකපත් සඳහා ප්‍රථම ස්ථානයකට ලකුණු දෙකක් ද වශයෙන් අනෙකුත් ස්ථාන සඳහා දශමස්ථාන වලින් ලකුණු එකතු වන ආකාරයට උපරිම ලකුණු 10 ක් සිව්වන පරීක්ෂණයේ දී ප්‍රදානය කෙරේ.

උදාහරණ ලෙස, ලකුණු ලබාදීම සඳහා සළකා බලන ඉසව් පහත දක්වා ඇත.

**ජාතික තලය**

නිර්මාණාත්මක රචනය, කථිකත්වය, පිටපත් රචනය (Creative Writing Oratory, Script Writing) පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය ,සංස්කෘතික අමාත්‍යාංශය හා ජාතික තරුණ සේවා සභාව වැනි ආයතන මගින් පවත්වනු ලබන අවුරුද්දකට නොඅඩු මුද්‍රා නාට්‍ය/නාට්‍ය, ජනමාධ්‍ය, ජනසන්නිවේදන පාඨමාලා මගින් ප්‍රදානය කරන ලද සහතික

**ඒක පුද්ගල ඉදිරිපත් කිරීම් ජාතික තලය**
ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය, තෙවන ස්ථානය

**කණ්ඩායම් ලෙස ඉදිරිපත් කිරීම ජාතික තලය**
ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය, තෙවන ස්ථානය

**ජාත්‍යන්තර තලය**

**ඒකපුද්ගල ඉදිරිපත් කිරීම් ජාත්‍යන්තර තලය**
රන් පදක්කම/ප්‍රථම ස්ථානය, රිදී පදක්කම/ දෙවන ස්ථානය, ලෝකඩ පදක්කම/තෙවන ස්ථානය, සහභාගීත්වය

**කණ්ඩායම් මට්ටමින් ඉදිරිපත් කිරීම් ජාත්‍යන්තර තලය**
රන් පදක්කම/ප්‍රථම ස්ථානය, රිදී පදක්කම/ දෙවන ස්ථානය, ලෝකඩ පදක්කම/තෙවන ස්ථානය, සහභාගීත්වය

කුසලතා ඇගයීමේ දී අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂයට පෙර වර්ෂ 3කට අදාළ සහ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂයට පසු වර්ෂයකට අදාළ කුසලතා සහතික පමණක් සළකා බලනු ලැබේ.

**(5) අභියෝග්‍යතා පරීක්ෂණයේ පරීක්ෂණ මණ්ඩල සංයුතිය**

එක් එක් පරීෂණ මණ්ඩල සඳහා වෙන වෙනම කණ්ඩායම් ඇතුළත් වේ. අංශප්‍රධාන හැර වෙනත් අයට මණ්ඩල දෙකක් නියෝජනය කළ නොහැකිය. පරීක්ෂණ මණ්ඩල 04 සඳහා එක් එක් අපේක්ෂකයා/අපේක්ෂිකාව එක් දිනක් තුළ මුහුණ දිය යුතුය.

එක් අපේක්ෂකයකුට පරීක්ෂණ මණ්ඩල 04 සඳහා දිනකට මුහුණ දීමට ගතවන කාලය අනුව දිනකට කැඳවන අපේක්ෂක/අපේක්ෂිකාවන් ප්‍රමාණය පීඨය විසින් තීරණය කළ යුතුය.

**පළමු පරීක්ෂණ මණ්ඩලය**

i අධ්‍යයනාංශ ප්‍රධාන හෝ ඔහු/ඇය විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් තිදෙනෙක්- 03
ii නාට්‍ය රචනය සහ අධ්‍යක්ෂණය පිළිබඳ බාහිර විෂය ප්‍රවීණයන් දෙදෙනෙක් - 02
iii නාට්‍ය රචනය සහ අධ්‍යක්ෂණය පිළිබඳ බාහිර කථිකාචාර්ය/ ඉහළ ප්‍රතිඵල ලැබූ ආදී විද්‍යාර්ථීන් දෙදෙනෙක් - 02

**දෙවන පරීක්ෂණ මණ්ඩලය**

i අධ්‍යයනාංශ ප්‍රධාන හෝ ඔහු/ඇය විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හෝ ඉන් ඉහල ශ්‍රේණියක දෙදෙනෙක් - 02
ii රූපණය පිළිබඳ බාහිර විෂය ප්‍රවීණයන් දෙදෙනෙක් - 02
iii රූපණය පිළිබඳ බාහිර කථිකාචාර්ය/ ඉහළ ප්‍රතිඵල ලැබූ ආදි විද්‍යාර්ථීන් දෙදෙනෙක් - 02

**තෙවන පරීක්ෂණ මණ්ඩලය**

i වෙනත් පීඨයක හෝ විශ්වවිද්‍යාලයක මහාචාර්යවරුන් දෙදෙනෙක් - 02
ii පීඨයේ වෙනත් අධ්‍යයනාංශයක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හෝ ඉන් ඉහළ ශ්‍රේණියක අයෙක් - 01

**සිව්වන පරීක්ෂණ මණ්ඩලය (සහතික පරීක්ෂාව)**
ලේඛකාධිකාරී හෝ ඔහු විසින් නම් කරනු ලබන පරිපාලන නිලධාරීවරයෙකු, පීඨයේ සහකාර ලේඛකාධිකාරී හා අධ්‍යයන හා ශිෂ්‍ය සේවා අංශයේ සහකාර ලේඛකාධිකාරී හෝ නියෝජිතයකු

සම්පූර්ණ පරීක්ෂණ මණ්ඩල සාමාජිකත්වය 20කි. මෙම පරීක්ෂණ මණ්ඩලවලට ඒ ඒ පීඨයන් නියෝජනය කරන බාහිර මහාචාර්යවරුන් හෝ ඒ හා සමාන්තර විෂය ප්‍රවීණයන් ඇතුලත් විය යුතුය. පරීක්ෂක මණ්ඩල සංයුතිය සඳහා පීඨ මණ්ඩලයේ හා සනාතන සභාවේ අනුමැතිය ලබාගෙන තිබිය යුතුය. අපේක්ෂකයකු/අපේක්ෂිකාවක විසින් ඉහත දක්වා ඇති සියලු පරීක්ෂණ වලින් ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණයේ එකතුව ලකුණු 50 කි.

ඉහත නිර්ණායක සහ ක්‍රමවේදය 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සරත් චන්ද්‍රජීව**
**උපකුලපති**

පිටපත - පීඨාධිපති/නර්තන හා නාට්‍ය කලා පීඨය
සහකාර ලේඛකාධිකාරී/නර්තන හා නාට්‍ය කලා පීඨය